*සැ.යු.:* 2025.11.07 දින පළ කරන ලද අංක 2462 *ගැසට් පත්‍රයේ* II සහ IV(අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,463 - 2025 නොවැම්බර් මස 14 වැනි සිකුරාදා - 2025.11.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 418 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 419 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තතු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 දෙසැම්බර් මස 05 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 නොවැම්බර් මස 21 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2025 ජූනි මස 09 වැනි දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ ගාල්ල දිස්ත්‍රික්කයේ, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් එල්. එන්. පියුමලී ලියනගේ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1994.07.12 දින ප්‍රදානය කර ඇති අංක ගා/9/ප්‍ර15439 - බෝපෝ/මුල/ඉ. ලෙ. 138 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන පෝද්දල, නරාවල, මුලනහේන පදිංචි හල්විටිය කංකානම් ගේ සිරිපාල වෙත ප්‍රදානය කොට ගාල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. බී 04/24 යටතේ 1994.09.21 වන දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2025.12.05 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩවත් සතර පත්තුවේ/කෝරලයේ III එෆ් මුලන නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නරාවල නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 90.03.02 ඕ 18/35-37 දරන ක්ෂේත්‍ර පත්‍රයේ සහ අංක මු. පි. ගා. 2506 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 31 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.046 ක් විශාලත්වයක් ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම; මුලනහේන

*උතුරට* : කැබලි අංක 32 සහ 16
*නැගෙනහිරට* : කැබලි අංක 30
*දකුණට* : කැබලි අංක 39 සහ 40
*බස්නාහිරට* : කැබලි අංක 40, 39 සහ 38

එල්. එන්. පියුමලී ලියනගේ,
ප්‍රාදේශීය ලේකම්,
බෝපෙ පෝද්දල.

2025 අප්‍රේල් මස 04 වැනි දින.

11-174/2

---

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ ගාල්ල දිස්ත්‍රික්කයේ, නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් සදිශානි ලක්නිමා යද්දෙහිගේ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) වන උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996.01.23 දින ප්‍රදානය කර ඇති අංක ගා/14/ප්‍ර - 36388 එල්. එල්. 20836 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කැටගොඩ පදිංචි උඩලමත්ත ගමගේ ජයතිස්ස වෙත ප්‍රදානය කොට ගාල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. කේ. 15/146 යටතේ 1996.11.18 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2025.12.05 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උතුරු ගගබඩ පත්තුවේ/කෝරලයේ කැටගොඩ උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කැටගොඩ නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, ගාල්ල දිස්ත්‍රික් මැනුම් අධිකාරිභාරයේ ඇති අංක අ. ග. සි. 526 දරන කට්ටි කැඩීමේ පිඹුරේ ප්‍රමාණයෙන් අක්කර 01 (එකයි) ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම

*උතුරට* : ගම් සභා පාර,
*නැගෙනහිරට* : ඩබ්. ජී. මර්තේනිස් යන අයගේ ඉඩම
*දකුණට* : සිරිල් අබේසුන්දර භුක්ති විදින ඉඩම,
*බස්නාහිරට* : ගුණසේකර යන අය භුක්ති විදින ඉඩම

සදිශානි ලක්නිමා යද්දෙහිගේ,
ප්‍රාදේශීය ලේකම්,
නාගොඩ.

2025 ජූලි මස 09 වැනි දින.

11-174/3

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (4) උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ ගාල්ල දිස්ත්‍රික්කයේ, නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් සදිශානි ලක්නිමා යද්දෙහිගේ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) වන උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1986.07.31 වැනි දින ප්‍රදානය කර ඇති අංක ගා/ප්‍ර/8447 - එල්. එල්. 36695 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන නියාගම ගමගේ ඩැනී යන අය වෙත ප්‍රදානය කොට ගාල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. කේ 3ඒ/63 යටතේ 1987 පෙබරවාරි මස 11 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2025.12.05 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

ගාල්ල දිස්ත්‍රික්කයේ, ගහබඩ පත්තුව උතුර ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ, ගහබඩ පත්තුවේ ඌරල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ඌරල නමැති ගමේ පිහිටා ඇති, අංක මු. පි. ගා. 1805 දරන පිඹුරෙහි අංක 43 දරන බිම් කැබැල්ල වශයෙන් නිරුපණය කර ඇති, ප්‍රමාණයෙන් රූඩ් 01 (එකයි) පර්චස් 04 (හතර) ක් ඇතැයි ගණන් බලා තිබෙන අරලියකන්ද යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය :-

| | |
|---|---|
| *උතුරට* | : මෙම ඉඩමේ කැබලි අංක 39 හා 40, |
| *නැගෙනහිරට* | : මෙම ඉඩමේ කැබලි අංක 40 හා 42 |
| *දකුණට* | : මෙම ඉඩමේ කැබලි අංක 32, 42 හා 44 |
| *බස්නාහිරට* | : මෙම ඉඩමේ කැබලි අංක 32 හා 44 |

සදිශානි ලක්නිමා යද්දෙහිගේ,
ප්‍රාදේශීය ලේකම්,
නාගොඩ.

2025 ජූලි මස 16 වැනි දින.

11-174/4

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/79773
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : NCP/PLC/L5/MT/04/*
දීර්ඝකාලීන

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මිහින්තලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 576, කහපත්විලගම ග්‍රාම නිලධාරී වසමේ තිරප්පනේ ගමේ බලයලත් මිනින්දෝරු විසින් සකස් කරන ලද අංක 03126 දරන අනුරේඛනයේ කැබලි අංක 01න් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 6.0696 ක් වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුත්තක් සඳහා ඉකෝ පවර් රිනිවබල් එනර්ජි (පුද්ගලික) සමාගම විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ.

| | |
|---|---|
| *උතුරට* | : පාර සහ රජයේ ඉඩම් |
| *නැගෙනහිරට* | : රජයේ ඉඩම් |
| *දකුණට* | : රජයේ ඉඩම් |
| *බටහිරට* | : රජයේ ඉඩම් |

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

(අ) *බදු කාලය.* - අවුරුදු තිහයි. (30) (2025.09.26 දින සිට 2055.09.25 දක්වා)

(ආ) *වාර්ෂික බදු මුදල* .- 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ හෝ පහකට වඩා වැඩිවන (රු. 5,000,000) වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳ පොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල* :- වාර මුදලක් අය නොකෙරේ.

(ඇ) මෙම ඉඩම වානිජ කටයුත්තක් සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඇ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* සාදා ඇති /සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(උ)* බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* 2025.09.26 දින සිට වසර පහක් ගතවන තුරු අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොලියක් අයකරනු ලැබේ.

*අනෙකුත් විශේෂ කොන්දේසි* :

(*අ*) භූමියට ඉහළින් සූර්යය පැනල ඉදිකර භූමියේ යටි වගාවක් සිදු කළ යුතුය.

(*ආ*) සියඹලාගස්වැව යෝජිත රක්ෂිත මායිමට යාව පවතින බැවින් යෝජිත රක්ෂිතයේ සිට මීටර් 10ක ප්‍රේරණ කලාපයක් අතහැර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුය.

මෙම නිවේදෙනය පල වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 ඔක්තෝබර් මස 30 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

11-113/1

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/79774
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : NCP/PLC/L5/MT/04/*
දීර්ඝකාලීන

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මිහින්තලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 581, මරදන්කල්ල ග්‍රාම නිලධාරි වසමේ ඇලැප්පන්කුලම ගමේ බලයලත් මිනින්දෝරු විසින් සකස් කරන ලද අංක 03125 දරන අනුරේඛනයේ කැබලි අංක 01න් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර 4.6989 ක් වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුත්තක් සඳහා ඉකෝ පවර් රිනිවබල් එනර්ජි (පුද්ගලික) සමාගම විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ.

| | |
|---|---|
| *උතුරට* | : පාර සහ රජයේ ඉඩම් |
| *නැගෙනහිරට* | : රජයේ ඉඩම් |
| *දකුණට* | : රජයේ ඉඩම් |
| *බටහිරට* | : රජයේ ඉඩම් |

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහයි. (30) (2025.09.26 දින සිට 2055.09.25 දක්වා)

*(ආ)* *වාර්ෂික බදු මුදල* .- 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ හෝ පහකට වඩා වැඩිවන (රු. 5,000,000) වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳ පොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල* :- වාර මුදලක් අය නොකෙරේ.

*(ඇ)* මෙම ඉඩම වාණිජ කටයුත්තක් සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* සාදා ඇති /සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* 2025.09.26 දින සිට වසර පහක් ගතවන තුරු අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අයකරනු ලැබේ.

*අනෙකුත් විශේෂ කොන්දේසි :*

*(අ)* භූමියට ඉහළින් සූර්යය පැනල ඉදිකර භූමියේ යටි වගාවක් සිදු කළ යුතුය.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 ඔක්තෝබර් මස 30 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලයේ
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

11-113/2

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/76944
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : UPLC/L/13/BW/L/542/*

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 65ඒ, දකුණු කැබිල්ලේවෙල ග්‍රාම නිලධාරී වසමේ දකුණු කැබිල්ලේවෙල ගමේ අංක 0664 අනුරේඛනයේ කැබලි අංක 1 මගින් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0152 ක් වූ ඉඩම් කොටස සමිති කටයුතු සඳහා සමගි මරණාධාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ.

| | |
|---|---|
| *උතුරට* | : මාර්ග රක්ෂිතය |
| *නැගෙනහිරට* | : සමුපකාර ගොඩනැගිල්ල සඳහා වෙන් කළ ඉඩම |
| *දකුණට* | : ක්‍රීඩා පිටිය සඳහා වෙන්කළ රජයේ ඉඩම |
| *බටහිරට* | : මාර්ග රක්ෂිතය |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය.* - අවුරුදු 05 පහයි. (2025.09.26 සිට 2030.09.25 දක්වා)
වාර්ෂික බදු මුදල : ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 2025 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2% කි.

*(ආ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම සමිති කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදිය යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඉ)* සාදා ඇති / සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඇ)* 2025.09.26 දින සිට වසර පහක් ගතවන තුරු අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඈ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොලියක් අයකරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 ඔක්තෝබර් මස 27 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

11-147

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.